## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : යොමු අංකය : .......................... දිනය : ................

1.2 අමාත්‍යාංශය : යොමු අංකය : .......................... දිනය : ................

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම: යොමු අංකය : .......................... දිනය: ..................

1.4 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : .......................... දිනය : ................

1.5 සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : PPSC/ES/06/FI 01/01/1 දිනය : 2017.06.16

1.6 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය: යොමු අංකය : GS/ES/13/3/6 දිනය : 2017.08.01

1.7 සේවයේ උපලේඛන ගත තනතුරු සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටීන්ට අනුව ගන්නා ලද හෝ ගන්නා ලදැයි අදහස් කරනු ලබන හෝ කිසියම් පියවරකට හානියක් නොවන අයුරින් මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2013 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය. එම බඳවා ගැනීමේ පටිපාටීන් හා උසස් කිරීමේ පටිපාටීන් වල මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහයට පටහැනි කිසියම් විධිවිධානයක් ඇතුළත්ව ඇත්නම් ඒවා ක්‍රියාත්මක වීම මෙම දිනයේ සිට නතර වනු ඇත. එවැනි විධිවිධානයන් මෙම ව්‍යවස්ථාවට අනුකූලවන පරිදි සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් පියවර ගත යුතුව ඇත.

**02. පත්කිරීමේ බලධරයා පිළිබඳ විස්තර :-**

2.1 පත් කිරීමේ බලධාරියා :

පුහුණු කිරීමේ ශ්‍රේණිය, III ශ්‍රේණිය, II ශ්‍රේණිය, I ශ්‍රේණිය සහ විශේෂ ශ්‍රේණිය - සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය/සේවා ගණ**

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය

3.1 ශ්‍රේණි : III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
විශේෂ ශ්‍රේණිය

යොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.07.27 දින අනුමත කර ඇති බව සහතික කරමි.
දිනය:- 2017.08.01
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

**04.** **පැවරෙන කාර්ය පිළිබඳ පොදු නිර්වචනය :**

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබාගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය, තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකරණය යා කාර්යයන් ඇතුළත් බහුකාර්ය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන ඉංජිනේරු, විද්‍යාත්මක, කෘෂිකර්ම සහ සත්ත්ව නිෂ්පාදන වැනි වෘත්තීමය සේවාවන්ට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටුකරන නිලධාරි ගණයකි.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : III, II , I ශ්‍රේණි - (MN-3-2006-A)
විශේෂ ශ්‍රේණිය - (MN-7-2006-A)

5.2 වැටුප් පරිමාණය : III, II , I ශ්‍රේණි - රු.15,005-4x180-6x240-11x320-20x360-රු.27885/-
විශේෂ ශ්‍රේණිය - රු.20,030-11x365-18x500-රු.33,045/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 | රු.15,005/- |
| II ශ්‍රේණිය | 12 | රු.17,485/- |
| I ශ්‍රේණිය | 23 | රු.21,045/- |
| විශේෂ ශ්‍රේණිය | 04 | රු. 21,125/- |

5.4 පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (II) අනුව
1 වසර- රු.12,920/-
2 වසර - රු.13,040/-

**06.** සේවයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ශ්‍රේණි :

සබරගමුව පළාතේ එක් එක් අමාත්‍යාංශයේ , දෙපාර්තමේන්තුවේ, ආයතනයේ ශීර්ෂය යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ තනතුරු ලෙසින් අනුමත කරන ලද තනතුරු මෙම සේවයට අයත් වේ. (උපලේඛන - 01) එක් එක් තනතුරට පැවරෙන කාර්යභාරය එම තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කළ යුතුය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III , II , I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ. ඉන් පරිබාහිරව විශේෂ ශ්‍රේණිය සඳහා සේවා අවශ්‍යතාවය අනුව අනුමත සේවක සංඛ්‍යාවක් වෙනම පැවතිය හැකිය.

6.3 තනතුරෙහි ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

යොමු අංකය :- GS/ESI/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017-07-27 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2017.08.01

**07.** බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාල නොවේ. |

සටහන:-

I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහාවන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල පළාත් සභාවේ දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03 ට අඩු නම් බඳවාගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2. **විවෘත බඳවා ගැනීම :**

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :

7.2.1.1. පුහුණු කිරීමේ ශ්‍රේණිය : (දෙවසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. (එක් එක් තනතුරට අදාල විෂයයන් බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කළ යුතුය.)

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

7.2.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය : (එක් වසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. (එක් එක් තනතුරට අදාල විෂයයන් බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කළ යුතුය.)

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාල ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම.(උදාහරණ : ජතික තාක්ෂණ සහතිකය සිවිල් / විදුලි/ යාන්ත්‍රික)

හෝ

II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැළසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

හෝ

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාල ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

හෝ

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසකම්වලට සියළු අතින් සමාන යැයි තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසකමක් ලබා තිබීම.

සටහන: (I) III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

(II) III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාල සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරිමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.

7.2.1.3 III වන ශ්‍රේණිය (විවෘත)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

(I) ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා / ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. (එක් එක් තනතුරට අදාල විෂයයන් බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කළ යුතුය.)
සහ

(II) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

(I) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණි ඩිප්ලෝමාව,

හෝ

(II) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

හෝ

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(IV) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව,

හෝ

ගොනු අංකය :-GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 ..........................දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2017.08.01

(V) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

(VI) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

(VII) රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(VIII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතිකය නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසකමක් ලබා තිබීම.

සටහන:

ඉහත 7.2.1.1, 7.2.1.2 හෝ 7.2.1.3 අතුරින් තනතුරට අදාලවන පරිදි සහ ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන කාණ්ඩයක්/ කාණ්ඩ බඳවා ගැනීමේ පරිපාටිවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ.

7.2.1.2 (ආ) සහ 7.2.1.3(ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකම් අතරින් තනතුරට අදාලවන පරිදි සුදුසුකම් එකක් හෝ කිපයක් තෝරාගෙන අදාල බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් කළ යුතුය.

7.2.2 කායික සුදුසුකම් :

සබරගමුව පළාත් සභාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

යොමු අංකය :- CS/ES/13/8/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 ..........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

7.2.3 වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III.යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුල ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුල අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුල සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V.සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.4 වයස:

7.2.4.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.4.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.5 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත තරඟ විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.5.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිමලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

(විෂය නිර්දේශය අදාල බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් කළ යුතුය.)

7.2.5.1.1 පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

7.2.5.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.07.27 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

7.2.5.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදුකෙරේ.

7.2.5.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.2.6 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : පුවත්පත් දැන්වීමක් හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :

7.3.1.1 පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයන සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා/පෙළ) විභාගය විසයන් හයකින් (06) සමත්වීම.

(ඇ) පළපුරුද්ද : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර , දෙපාර්තමේන්තු ගත තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා/පෙළ) විභාගය විසයන් හයකින් (06) සමත්වීම

(ආ) වෘත්තීය සුදුසුකම්: තනතුරට අදාල 7.2.1.2. (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් සමග අදාල ක්ෂේත්‍රයේ වසර 05 ක පලපුරුද්ද

(ඇ) පළපුරුද්ද : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර , දෙපාර්තමේන්තුගත තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.1.3 III වන ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම -සීමිත)

(අ) අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයයනට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම

(ආ) වෘත්තීය සුදුසුකම්: තනතුරට අදාලව 7.2.1.3 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

(ඇ) පළපුරුද්ද: ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර , දෙපාර්තමේන්තු ගත තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

7.3.2 කායික සුදුසුකම්

සබරගමුව පළාත් සභාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.3 වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. නියමිත දිනට පූර්වාසන්නව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

III.සේවයට බඳවා ගැනීම සඳහාවන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

(විෂය නිර්දේශය අදාල බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කළ යුතුය.)

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරී පමණක් සිදුකෙරේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාල නොවේ.

7.5 පුහුණු කාල සීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම

(අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාල බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අදාල ආයතනය විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. (පුහුණුව අවසානයේ පිළිගත හැකි සහතිකයක් අදාල ආයතනය විසින් නිකුත් කරනු ඇත. සහතිකය නිකුත් කර ආයතනය බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කළ යුතුය.)

(ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදාහැරේ.

(ඇ) දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ තනතුරු වෙතොත් එම අතිරේක පුහුණු කාලයන් සඳහා අතිරේක පුහුණු කාලයේ එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක් බැගින් ලබාදීමේ පදනම මත පුහුණුව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර , අතිරේක පුහුණු කාල සීමාව II ශ්‍රේණියට උසස් කිරීම සඳහා සළකා බලනු ලබන කාල සීමාවට ගණන් ගනු ලැබේ.

(ඇ) සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳීසිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාල සීමාව සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත්වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව වැටුප් පරිවර්ථනය කරනු ලැබේ.

(ඉ) කිසියම් තනතුරකට විවෘත හෝ සීමිත ධාරාව යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කර ගන්නා අයදුම්කරුවන්ගේ පුහුණු කාල සීමාව, අදාළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි අවස්ථාවෝචිතව වෙනස් විය යුතු වන්නේ නම්, ඒ සඳහා සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන අදාළ පුහුණු කාල සීමාව ඒ ඒ බඳවා ගැනීමේ පරිපාටිවල ඇතුලත් කිරීමට අදාළ පත්කිරීම් බලධරයන් විසින් කටයුතු කළ යුතුය.

යොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27.......දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

## 08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 02) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ II ශ්‍රේණියට උසස්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 03) |
| III වන කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :

වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද?

(අ) 1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම: සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි.

(ආ) 3 වන කාර්යක්ෂමතා කඩඉම : සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි.

සටහන : මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

## 09. භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අ. පො. ස. (සා/පෙළ) මට්ටමේ ප්‍රවීණතාවක් III වන ශ්‍රේණියේ වසර 5ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතුය. |

යොමු අංකය :- CS/ES/13/3/6
ස... පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

10. ශ්‍රේණි උසස් කිරීම්

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. 9 ඡේදයේ සඳහන් පරිදි අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාවයන් ලබා ගෙන තිබීම
VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීමේ බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

සටහන:

I. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

***10.1.1.1 හි II වගන්තිය වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සංශෝධනයට යටත්ව**

යොමු අංකය :- ES/ES/ [illegible]
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

### 10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

#### 10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත | අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය | අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 60% |

සටහන: විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේ දී පුරප්පාඩු ගණනය කළ යුතතේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

I. අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 75%ක් විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය ටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 66.67%ක් විය යුතුය.

II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 03කට වඩා අඩු වේ නම්, නිලධාරින්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදුකළ යුතුය.

#### 10.3.2 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගැනීම

##### 10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහාකර තාක්ෂණික (MN-3) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහම (05) නියමිත දිනට උපයාගෙන තිබීම

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

##### 10.3.2.2 බඳවා ගන්නා ආකාරය

පත්වීම් බලධරයා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරික්ෂණයක් මඟින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදුකරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - උපලේඛනය 04)

සටහන:

I. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාල කරගත යුතු වන්නේ එම විභාගය අදාල වන්නා වූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

II. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට නොහැකි වූයේ නම් ඊට පසු වර්ෂයක් පැවැත්වෙන විභාගයක ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාල කරගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂ වල පුරප්පාඩු ඇති වූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව තෝරා ගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස්කිරීම සිදුකරන දිනය ලෙස සළකනුයේ එම විභාගය පැවැත් වූ දිනය වේ.

***10.3.1හි සටහන යටතේ I වගන්තියෙහි බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ ලෙස සංශෝධනයට යටත්ව**

යොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 ...... දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

10.3.3 සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගැනිම

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහාකර තාක්ෂණික (MN-3) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙ වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) නියමිත දිනට උපයාගෙන තිබීම

II. උසස් කිරිමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරිමේ දිනට පෙරාතුව වූ වසර හයක්(06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.3.3.2.බඳවා ගන්නා ආකාරය

පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේ ශ්‍රේණියට උසස් කිරිම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - උප ලේඛනය 05)

11. තනතුරුවලට පත්කිරීම : අවශ්‍යතාවය පරිදි ඒ ඒ බඳවා ගැනිම් පරිපාටිවල අදාල පරිදි ඇතුළත් කළ යුතුය.

12.1 පරිවාස කාලය හා සේවය ස්ථිර කිරිම

I. විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරියෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

II. සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් වසරක වැඩ බැලීෙ කාලයකට යටත්ව පත්කරනු ලබන අතර ඔහු /ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.2 වෘත්තිමය සේවාවල කරනු ලබන උසස්වීම්

I. දෙපාර්තමේන්තුවල වෘත්තිමය සේවා වල සේවක සංඛ්‍යාෙවෙන් යම්කිසි ප්‍රතිශතයක් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් විභාගයකින් තෝරාගනු ලබන අයගේ උසස්වීම් සඳහා වෙන් කරයි.

II. එවැනි උසස්වීම් මාර්ග නොමැති තාක්ෂණ සේවයේ තනතුරු සඳහා ද එම මාර්ග ව්‍යාප්ත කළ යතුය. ඒ සඳහා 12.2.1. වගන්තියේ සඳහන් වෘත්තිමය සේවාවන්ට සමාන්තර දෙපාර්තමේන්තුගත එක් තනතුරක් හෝ ඇති කිරිමට දෙපාර්තමේන්තු ප්‍රධානින් ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

12.3 රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයන් ද සියළුම නිලධරයන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

යොමු අංකය :- GS/ES/13/6/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.07.27 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

13. අර්ථ නිරූපණ

I. 'ගැසට් නිවේදනය' යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

II. සේවා ව්‍යවස්ථාව යන්නෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

III. ක්‍රියාත්මක වන දිනය යන්නෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

IV. සේවය යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවය වේ.

V. ආධුනික නිලධාරියා යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ බඳවා ගනු ලැබ පුහුණු කිරීමේ ශ්‍රේණියක සිටින පුද්ගලයෙකි.

VI. සක්‍රීය සේවා කාලය යනුවෙන් ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. අන්තර්ග්‍රහණ විධිවිධාන

I. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN- 3-2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත් ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේවතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයේහි වෙනසක් සිදුනොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස් ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්ථනයේ දී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූප වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදුනොකළ යුතුය.

14.1 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින වන විට සේවයේ නියුතු නිලධරයන් නව සේවා ව්‍යවස්ථාව යටතේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදුකරනු ලැබේ.

14.1.1 සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තිය 'ආ' ඛණ්ඩයේ සිටින නිලධරයන්.

14.1.2 සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තිය 'අ' ඛණ්ඩයේ සිටින නිලධරයන්.

14.1.3 සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියේ සිටින නිලධරයන්

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.07.27 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2017.08.01

14.1.4 සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ සිටි නිලධරයන්

15. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2018.06.01 දක්වා බලපැවැත්වේ. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරින්ට උසස්වීම් ලබා දීමේ දී අන්තර්කාලය තුළ දී අදාල කරගත යුත්තේ 2006.01.06 දිනැති අංක 1426/34 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව සකස් කර 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.1.අ සහ 7.2.අ වගන්ති වේ. ( මෙම අන්තර්කාලීන විධිවිධාන අදාල වන්නේ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගත් නිලධරයන්ට පමණි. අනෙකුත් කොන්දේසි නව සේවා ව්‍යවස්ථාව අනුව වේ.)

16. වෙනත්

16.1

1. මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ලද පසු ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන :............................ පරීක්ෂා කළේ : ....................................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : සුනේත්‍රා ගුණවර්ධන

තනතුර: ලේකම්

දිනය : 2017.06.21

නිල මුද්‍රාව : සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර.

ගොනු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2017.08.01

යොමු අංකය : DCS/PT/MA/02/026/2017

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ................ හි කාර්යාල සේවයේ

යෝජිත ව්‍යවස්ථා සංග්‍රහය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ප්‍රධාන ලේකම්

සබරගමුව පළාත

හේරත් පී. කුලරත්න
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත,
නව නගරය - රත්නපුර.

දිනය : 2017/06/27

නිල මුද්‍රාව : ..............................

---

යොමු අංකය : PPSC/ES/06/FT/01/01/1

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ හි කාර්යාල සේවයේ

ව්‍යවස්ථා සංග්‍රහය 2017.06.16 දින සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි

අත්සන : ..............................

නම : සුනේත්‍රා ගුණවර්ධන

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත

දිනය : 2017.06.28

නිල මුද්‍රාව : ..............................

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

---

යොමු අංකය : ..............................

.............................................. හි ..............................................

ව්‍යවස්ථා සංග්‍රහය .............................. දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් විසින් අනුමත කරන ලදි.

යොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2017.08.01

අත්සන : ..............................

නම : ..............................

ආණ්ඩුකාරවර ලේකම්

සබරගමුව පළාත

දිනය : ..............................

නිල මුද්‍රාව : ..............................

උප ලේඛනය 01

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයට අයත් තනතුරු නාම ලේඛනය

කාර්මික නිලධාරි (සිවිල්)

කාර්මික නිලධාරි (විදුලි)

කාර්මික නිලධාරි (යාන්ත්‍රික)

කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂන)

සැලසුම් ශිල්පි

මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි

කෘෂිකර්ම උපදේශක

ජනපද නිලධාරි

සත්ත්ව සංවර්ධන උපදේශක

උපදේශක (යාන්ත්‍රික)

අත්සන ..........(signature)..........

නම: ..........සුනේත්‍රා ගුණවර්ධන..........

තනතුර: ..........ලේකම්..........

දිනය: ..........2017.06.21..........

නිල මුද්‍රාව: ..........සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

යොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27..........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2017.08.01 සබරගමුව පළාත.

උප ලේඛනය **02**

01. විභාගයේ නම: සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | කාලය පැය 02 කි. | 100 | 40% |
| මුදල් රෙගුලාසි | කාලය පැය 02කි. | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා.

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග

වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ - VIII, XII, XIII, XIV, XIX, වන පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | I වැනි පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා<br>III වැනි පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

අත්සන ........................................

නම: ....සුනේත්‍රා ගුණවර්ධන....

තනතුර: ....ලේකම්....

දිනය: ....2017.06.21....

නිල මුද්‍රාව: ....සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

යොමු අංකය :- ᏟS/EG/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 ........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනයː- 2017.08.01

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

උප ලේඛනය 03

01. විභාගයේ නම : සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02කි. | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02කි. | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග
වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII, වන පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | VI වැනි පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා<br>XIII වැනි පරිච්ඡේද<br>මුදල් රෙගුලාසි 685 සිට 775 දක්වා |

අත්සන ........................

නම: ........................

තනතුර: ලේකම්

දිනය: 2017 . 06 . 21

නිල මුද්‍රාව: සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017 . 07 . 27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2017 . 08 . 01 සබරගමුව පළාත.

උපලේඛනය 04

01. විභාගයේ නම : සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| කළමනාකරණය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග

අවශ්‍යතාවය පරිදි වසරකට එක් වරක් පවත්වනු ලැබේ

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන්<br>සැළසුම් කිරීම<br>තීරණ ගැනීම<br>තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>සංවිධානය<br>මාණ්ඩලීකරණය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>නායකත්වය<br>පාලනය<br>පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>III. සහභාගීත්ව කළමනාකරණය<br>IV. කළමනාකරණ පරිසරය<br>V. සිද්ධි අධ්‍යයනය |
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීනතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

ගොමු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2017.08.01

අත්සන ..........................
නම: සුනේත්‍රා ගුණවර්ධන
තනතුර: ලේකම්
දිනය: 2017.06.21
නිල මුද්‍රාව: සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

උපලේඛනය 04

01. විභාගයේ නම : සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| කළමනාකරණය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග

අවශ්‍යතාවය පරිදි වසරකට එක් වරක් පවත්වනු ලැබේ

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන්<br>සැළසුම් කිරීම<br>තීරණ ගැනීම<br>තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>සංවිධානය<br>මාණ්ඩලීකරණය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>නායකත්වය<br>පාලනය<br>පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>III. සහභාගීත්ව කළමනාකරණය<br>IV. කළමනාකරණ පරිසරය<br>V. සිද්ධි අධ්‍යයනය |
| අභියෝග්‍යතාව පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහල ප්‍රවීනතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

ගොනු අංකය :- GS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.07.27 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2017.08.01

අත්සන ..........................................

නම: සුනේත්‍රා ගුණවර්ධන

තනතුර: ලේකම්

දිනය: 2017.06.21

නිල මුද්‍රාව: සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

උපලේඛනය 05

01. විභාගයේ නම : සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පලපුරුද්ද<br>අදාල මූලික සුදුසුකම් ඉක්මවා සපුරා ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | 50 | |
| කුසලතාවය<br>(අවස්ථානුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාවය තීරණය කරනු ලැබේ.) | 45 | අදාල නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන බලධාරියා
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
අවශ්‍යතාවය පරිදි වර්ෂයකට එක් වරක්

අත්සන ..........

නම: සුනේත්‍රා ගුණවර්ධන

තනතුර: ලේකම්

දිනය: 2017.06.21

නිල මුද්‍රාව: සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

යොමු අංකය :- CS/ES/13/3/6
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017.07.27 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2017.08.01 සබරගමුව පළාත.